# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 42/38 — 1973 ජනවාරි 15 වැනි සඳුද — 1973.01.15

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## මිළ පාලන දැන්වීම්

අංක ඇම්ටී/12 දරණ ආහාර මිළ නියෝගය — කිරිඟු පිටි

මිළ පාලන පනත

නියෝගය

මාතර දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත් පත්තිනිකුට්ටිගේ ආනන්ද නවරත්න වන මම, (173 වන අධිකාරය වන) මිළ පාලන පනතේ (2) දරණ වගන්තිය සමග කියවිය යුතු 4 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව—

(1) 1969 දෙසැම්බර් 09 වැනි දින අංක 14,881/3 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1969 දෙසැම්බර් මස 06 වැනි දින අංක ඇම්ටී/7 දරණ ආහාර මිළ නියෝගය මේ දත් සිට අවලංගු කරමි.

(2) මීට යාකර ඇති 1 වැනි උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් පෙදෙස්වල කිරිඟු පිටි තොග වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තල් 148 ක් විකිණිය හැකි වැඩිම තොග මිල එම උපලේඛනයේ 2 වැනි තීරයේ අනු පිළිවෙලින් සඳහන් කර තිබෙන තොග මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) මීට යාකර ඇති 2 වැනි උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් පෙදෙස්වල කිරිඟු පිටි සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම සිල්ලර මිළ එම උපලේඛනයේ 2 වැනි තීරයේ අනු පිළිවෙළින් සඳහන් කර තිබෙන සිල්ලර මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(4) තවද, මෙම නියෝගයේ කාර්යය සඳහා—

(අ) කිරිඟු පිටි ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ කිරිඟු පිටි වරකට ශුද්ධ බර රාත්තල් 148 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් කොයි අන්දමකට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්,

(ආ) කිරිඟු පිටි පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ ශුද්ධ බර රාත්තල් 148 කට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්,

(ඇ) කිරිඟු පිටි හෝ ඉරිඟු පිටි එකට කලවම් කළ විට "කිරිඟු පිටි" නමින් හැඟවෙන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(5) තවද, කිරිඟු පිටි, ඉරිඟු පිටි හැර වෙන කිසියම් ද්‍රව්‍යයක් සමඟ මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බවද මෙයින් නියම කරමි.

(6) තවද, බරින් සියයට 10 කට වැඩියෙන් ඉරිඟු පිටි කලවම් කරන ලද කිරිඟු පිටි කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බවද මෙයින් නියම කරමි.

(7) තවද, කිරිඟු පිටි විකුණන විට යම්කිසි දෙයක ඔතනු ලැබේ නම් හෝ බහාලනු ලැබේ නම් එහි මිළත් මෙම නියෝගයෙන් නියමිත ගණන් වලට ඇතුළත් වන බවද මෙයින් නියම කරමි.

(8) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, යම් ස්ථානයක හෝ යම් වාහනයක හෝ කිරිඟු පිටි සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම කිරිඟු පිටි වලින් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා මෙම නියෝගයේ සඳහන් වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම්වලින් මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධ කොට නියමිත වැඩිම මිළ ඕනෑම ගනුදෙනුකාරයෙකුට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ හෝ තැබිය යුතු බවද නියම කරමි.

(9) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම කිරිඟු පිටි තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් හෝ විකුණන සෑම තැනැත්තෙකු විසින්ම මිළයට ගන්නා අයෙකු විසින් ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම්—

(අ) විකුණූ දිනය,

(ආ) කිරිඟු පිටි විකුණූ ප්‍රමාණය (බර අනුව),

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල,

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම්, වෙළඳාම තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවද නියම කරමි.

(10) එසේම මෙම නියෝගයේ කාර්ය සඳහා "රාත්තල" හෙවත් "රා" යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමයට සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

1973 ජනවාරි මස 12 වැනි දින පෙරවරු 11 ට මාතර කච්චේරියේ දී අත්සන් කරන ලදී.

පී. ඒ. නවරත්න,
මාතර දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක

පළමුවැනි උපලේඛනය

| | 1 වැනි තීරය<br>ප්‍රදේශ | 2 වැනි තීරය<br>රාත්තල් 148 ක ශුද්ධ බරක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම තොග මිල<br>රු. ශ. |
|---|---|---|
| 1. | මාතර නගර සහා සීමාව තුළ, දෙවිනුවර සුළු නගර සභා සීමාව තුළ, මඩිහ-ගොඩගම, අපරැක්ක-බඹරැන්ද, නායිමන-මාකාවිට සහ කැකනදුර ගම් සහා සීමා තුළ ... ... ... ... ... | 56 85 |
| 2. | ගන්දර, කෝට්ටගොඩ සහ තිහගොඩ ගම්සහා සීමා තුළ ... ... ... ... | 56 88 |
| 3. | හක්මණ-වලකඩ ගම්සහා සීමාව තුළ ... ... ... ... ... | 57 12 |
| 4. | කඹුරුපිටිය, කිරින්ද-පුහුල්වැල්ල සහ දික්වැල්ල ගම්සහා සීමා තුළ ... ... ... ... | 57 04 |
| 5. | ගොඩපිටිය ගම්සහා සීමාව තුළ ... ... ... ... ... ... | 57 08 |
| 6. | රංචාගොඩ සහ දෙයියන්දර ගම්සහා සීමා තුළ ... ... ... ... ... | 57 26 |
| 7. | මොරවක ගම්සහා සීමාව තුළ (පිටබැද්දර ග්‍රාම සේවක කොට්ඨාශ හැර) ... ... ... | 57 32 |
| 8. | දෙනියාය ගම්සහා සීමාව තුළ (කොටපොල දකුණ සහ කොටපොල උතුර ග්‍රාම සේවක කොට්ඨාශ හැර) ... | 57 56 |
| 9. | පිටබැද්දර ග්‍රාම සේවක කොට්ඨාශය තුළ ... ... ... ... ... | 57 16 |
| 10. | කොටපොල දකුණ සහ කොටපොල උතුර ග්‍රාම සේවක කොට්ඨාශ සහ බෙරලපනාතර සහ බෙන්ගමුව ගම්සහා සීමා තුළ | 57 42 |
| 11. | වැලිගම නගර සභා සීමාව තුළ සහ වැලිගම සහ මිරිස්ස ගම්සහා සීමා තුළ ... ... ... | 56 75 |
| 12. | අකුරැස්ස සුළු නගර සභා සීමාව තුළ සහ මාරඹ සහ කනංකේ ගම්සහා සීමා තුළ ... ... ... | 56 94 |
| 13. | මාලිම්බඩ ගම්සහා සීමාව තුළ ... ... ... ... ... ... | 56 83 |

දෙවැනි උපලේඛනය

| | 1 වැනි තීරය<br>ප්‍රදේශ | 2 වැනි තීරය<br>ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම සිල්ලර මිල<br>රු. ශ. |
|---|---|---|
| 1. | මාතර සහ වැලිගම නගර සභා සීමා තුළ දෙවිනුවර සහ අකුරැස්ස සුළු නගර සභා සීමාව තුළ, මඩිහ-ගොඩගම, අපරැක්ක-බඹරැන්ද, නායිමන– මාකාවිට, ගන්දර, කෝට්ටගොඩ, වැලිගම, මිරිස්ස, මාරඹ, කනංකේ, මාලිම්බඩ සහ කැකනදුර ගම්සහා සීමා තුළ ... ... ... ... ... ... | 0 40 |
| 2. | හක්මණ-වලගඩ, කඹුරුපිටිය, කිරින්ද-පුහුල්වැල්ල, ගොඩපිටිය, දික්වැල්ල, රංචාගොඩ, දෙයියන්දර, මොරවක, තිහගොඩ, දෙණියාය, බෙරලපනාතර සහ බෙංගමුව ... ... ... ... ... | 0 40 |

සැලකිය යුතුයි.—(1) මේ මිල ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. එම මිළ ගණන්වලට ඉහලින් ද්‍රව්‍ය විකිණිය නොහැක.

(2) ශුද්ධ බර රාත්තල් 148 කට අඩු හෝ වැඩි කිසියම් තිරිඟු පිටි ප්‍රමාණයක් තොග වශයෙන් විකුණන විට ශුද්ධ බර රාත්තල් 148 ක් තොග වශයෙන් විකිණිය හැකි ඉහත සඳහන් වැඩිම තොග මිළේ අනුපාතනය අනුව ගෙවිය යුතු මිල ගණන් බැලිය යුතුයි.

1—865/1

---

අංක ඇමටී/13 දරණ ආහාර මිළ නියෝගය — පාන්

මිළ පාලන පනත

නියෝගය

මාතර දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත්, පත්තිනිකුට්ටිගේ ආනන්ද නවරත්න වන මම, (173 වන අධිකාරය වන) මිළ පාලන පනතේ 3 (2) දරණ වගන්තියත් සමග කියවිය යුතු 4 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව—

(1) 1969 දෙසැම්බර් 07 වැනි දින අංක 14,881/2 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 1969 දෙසැම්බර් 04 වැනි දින අංක ඇමටී/10 දරණ ආහාර මිළ නියෝගය මෙතැන් සිට අවලංගු කරමි ;

(2) මීට යාකර ඇති උපලේඛනයේ 2 වැනි සහ 3 වැනි තීරවල සඳහන් මිළ එම උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ප්‍රදේශවල, පිළිවෙලින් අවුන්ස 16 යේ සහ අවුන්ස 8 වේ පාන් ගෙඩි විකිණිය හැකි වැඩිම මිළ බවත්, එකී මිළට වැඩියෙන් එම ප්‍රදේශවල එම පාන් ගෙඩි නො විකිණිය යුතු බවත් වහාම ක්‍රියාත්මක වන පරිදි මෙම නියෝගයෙන් නියම කරමි ;

(3) තවද, මෙම මිළ නියෝගයෙන් කිසිම ප්‍රදේශයක් සඳහා අවුන්ස 16 යේ පාන් ගෙඩියකට නියමිත වැඩිම මිලේ අනුපාතය අනුව වැටහෙන මිළට වැඩියෙන් එම ප්‍රදේශය තුළ අවුන්ස 8 කට වඩා බර පාන් ගෙඩියක්, අවුන්ස 8 කට වඩා බර කිසියම් කොටසක් හෝ නො විකිණිය යුතු බවත් නියෝග කරමි ;

(4) මෙම මිළ නියෝගයෙන් කිසියම් ප්‍රදේශයක් සඳහා අවුන්ස 8 වේ පාන් ගෙඩියකට නියමිත වැඩිම මිලේ අනුපාතය අනුව වැටහෙන මිළට වැඩියෙන්, එම ප්‍රදේශය තුළ අවුන්ස 8කට වඩා බර නොවූ පාන් ගෙඩියක් හෝ පාන් ගෙඩියකින් අවුන්ස 8 කට වඩා බර නොවූ කිසියම් කොටසක් හෝ නො විකිණිය යුතු බවත් නියෝග කරමි ;

(5) පාන් විකුණන විට ඔතා දෙනු ලබන දෙයක් වෙතොත් එහි මිළත් මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන්වලට ඇතුළත් බවත් නියෝග කරමි ;

(6) මෙම නියෝගයෙන් වැඩිම මිළ නියමකොට ඇති සෑම ප්‍රදේශයකම සිය ස්වාමිත්වයේ හෝ පාළනය යටතේ හෝ කිසියම් ස්ථානයක හෝ වාහනයක හෝ පාන් ඇති වෙළෙන්දෙකු මෙම නියෝගයෙන් පාන් සඳහා නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරණ ලද දැන්වීමක් පැහැදිලිව පෙනෙන සේ එම ස්ථානයේ හෝ වාහනයේ හෝ තැබිය යුතු බවත් නියෝග කරමි ;

(7) මෙම නියෝගයෙන් වැඩිම මිළ නියමකොට ඇති සෑම ප්‍රදේශයකම පාන් විකුණන සෑම කෙනෙකුම මිළට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ පාන් ගෙඩියේ විස්තර ;

(ඇ) විකුණූ පාන් ප්‍රමාණය ;

(ඈ) විකුණූ පාන්වලට ගෙව් මුදල ඇතුළත් කුවිතාන්සියක් මිලට ගන්නාට දිය යුතු බව මෙම නියෝගයෙන් නියම කරමි ;

(8) තවද, " අවුන්ස " යන්නෙන් සලකුණු ලබන්නේ ඇවැර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත අවුන්සයේ බර බවද නියෝග කරමි.

1973 ජනවාරි මස 12 වැනි දින පෙ.ව. 11 ට මාතර කච්චේරියේ දී අත්සන් කරන ලදී.

පී. ඒ. නවරත්න,
මාතර දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක.

උපලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය | 3 වැනි තීරය |
|---|---|---|
| ප්‍රදේශය | අවුන්ස 8 කට වඩා බර පාන් සඳහා අදල වැඩිම මිළ | අවුන්ස 8 ක් බර පාන් සඳහා අදල වැඩිම මිළ |
| | රු. ශ. | රු. ශ. |
| මාතර සහ වැලිගම නගර සහා සීමාව තුළ, දෙව්නුවර සහ අකුරැස්ස සුළු නගර සහා සීමා තුළ, ගන්දර, කෝට්ටගොඩ, මාරඹ, කනංකේ, වැලිගම, මිරිස්ස, මඩිහ–ගොඩගම, කැකනදුර, අපරැක්ක–බඹරැන්ද, නායිමන–මාකාවිට, මාලිම්බඩ සහ තිහගොඩ ගම්සභා සීමා තුළ ... | 0 40 අවුන්ස 16 ක් ... | 0 20 අවුන්ස 8 ක් |
| මාතර දිස්ත්‍රික්කයේ ඉහත සඳහන් නොවූ සියළුම ප්‍රදේශ තුළ ... ... | 0 41 අවුන්ස 16 ක් ... | 0 20 අවුන්ස 8 ක් |

සැළකිය යුතුයි.—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය හැකි නියම මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ වේ. මේ මිළ ගණන්වලට ඉහළින් ඒ ද්‍රව්‍යය විකිණිය නො හැකිය.

1—365/2

---

අංක වී. 110 දරණ ආහාර මිළ නියෝගය (කිරිහු පිටි)

මිළ පාලන නියෝගය

(173 වන පරිච්ඡේදය)

වවුනියා දිසාවේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත් කන්දයියා සිවප්‍රකාසම් වන මම, මිළ පාලන පනතේ (173 පරිච්ඡේදයේ) 3(2) වන වගන්තිය සමහ කියවිය යුතු 4 වන වගන්තියේ මට පැවරී ඇති බලතල අනුව—

(1) 1968.02.21 වන දින අංක 14,789/19 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1968.01.18ද අංක වී. 109 දරණ මගේ ආහාර මිළ නියෝගය වහාම මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උප ලේඛනයේ 2 වන තීරයේ සඳහන් වී ඇති මිළ ගණන් එම උපලේඛනයේ 1 වන තීරයේ සඳහන් ප්‍රදේශයන් තුළ කිරිහු පිටි ශුද්ධ බර රාත්තල් 148 ක ප්‍රමාණයක් තොග වශයෙන් විකිණීමේදී වැඩිම තොග මිළ ගණන් බව වහාම නියෝග කරමි.

(3) මීට යාකර ඇති උපලේඛනයේ 3 වන තීරයේ සඳහන් වී ඇති මිළ ගණන් එම උපලේඛනයේ පළවන තීරයේ සඳහන් ප්‍රදේශයන් තුළ කිරිහු පිටි ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණීමේ වැඩිම මිළ ගණන බව වහාම නියම කරමි.

(4) තවද, මෙම නියෝගයේ කාර්ය සඳහා—

(අ) කිරිහු පිටි ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීමක් හෝ කිරිහුපිටි වරකට ශුද්ධ බර රාත්තල් 148 ක ප්‍රමාණයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත්,

(ආ) පාරිභෝගය හෝ පාවිච්චිය පිණිස කිරිහු පිටි ශුද්ධ බර රාත්තල් 148 කට අඩුව විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත්,

(ඇ) කිරිහු පිටි හා ඉරිහු පිටි එකට කලවම් කල විට එය ' කිරිහු පිටි ' නමින් ගැනෙන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(5) තවද කිරිහු පිටි ඉරිහු පිටි හැර වෙන කිසිම ද්‍රව්‍යයක් සමහ මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බවද මෙයින් නියෝග කරමි.

(6) තවද, බරින් සියයට 10 කට වැඩියෙන් ඉරිහු පිටි කලවම් කරන ලද කිරිහු පිටි කිසිවකු විසින් නොවිකිණිය යුතු බවද මෙයින් නියම කරමි.

(7) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලබන සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක හෝ කිරිහු පිටි සිය ස්වාමිත්වය යටතේ හෝ පාලනය යටතේ හෝ කබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම කිරිහු පිටි ප්‍රමාණයක් සුදුසු භාජනයක තබා එම ආහාර ද්‍රව්‍ය සඳහා මෙම නියෝගයේ වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩුනොවූ ඉලක්කම් වලින් මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධ කොට එම මිළ ඕනෑම ගණුදෙනු කාරයකුට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව නියම කරමි.

(8) එසේම මෙම නියෝගයෙහි කාර්ය සඳහා ' රාත්තල ' නොහොත් ' රා ' යන්නෙන් අදහස් කරන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(9) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් හෝ කිරිහු පිටි විකුණන සෑම තැනැත්තෙකුම විසින් මිළයට ගන්නා තැනැත්තා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම්—

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ කිරිහු පිටි වල බර ප්‍රමාණය ;

(ඇ) විකුණූ කිරිහු පිටි ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ; සහ

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම් වෙළඳාම තොග වශයෙන් ද, සිල්ලර වශයෙන්ද, යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවද නියෝග කරමි.

(10) තවද, කිරිහු පිටි විකිණීමේදී එම කිරිහු පිටි යම් කිසි දෙයක ඔතනු ලැබේනම් හෝ බහාලනු ලැබේනම් එහි මිළත්, එම නියෝගයෙන් නියම කරනු ලැබූ වැඩිම මිළ ගණන් වලට ඇතුළත් වන බවද, නියම කරමි.

1973 ජනවාරි 12 වන දින දවල් 12.00 ට වවුනියා දිසාපති කාර්යාලයේ දීය.

කේ. සිවප්‍රකාසම්,
වවුනියා දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලකතැන.

උපලේඛනය

| අංක | 1 වන තීරය<br>ප්‍රදේශය | 2 වන තීරය<br>ශුද්ධ බර රාත්තල් 148ක මිටියක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | 3 වන තීරය<br>ශුද්ධ බර රාත්තල් එකක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|---|
| 1 | වවුනියා දකුණු දෙමළ හා සිංහල ප්‍රා.ආ.නි. කොට්ඨාශයන් තුළ ... ... | 57 19 ... | 40 |
| 2. | වෙඩ්ඩිකුලම්හි, වෙන්ගලචෙඩ්ඩිකුලම් ප්‍රා.ආ.නි. කොට්ඨාශය තුල ... ... | 57 76 ... | 40½ |
| 3. | මාන්කුලම්; පුලියන්කුලම්, කනගරායන්කුලම් යන ගම්මුලාදෑනි කොට්ඨාශයන් හැර වවුනියා උතුර (නෙදුන්කර්ණි) ප්‍රා.ආ.නි. කොට්ඨාශය තුල ... ... | 57 67 ... | 40½ |
| 4. | මාන්කුලම්, පුලියන්කුලම්, කනගරායන්කුලම් යන ගම්මුලාදෑනි කොට්ඨාශයන් තුල ... | 57 76 ... | 40½ |
| 5. | මුහුදුබඩපත්තු ආදයම් නිළධාරී කොට්ඨාශය සහ පුදුකුඩියිරිප්පු ආදයම් නිළධාරි කොට්ඨාශය තුල ... ... ... ... ... | 58 06 ... | 40½ |

සැළකිය යුතුයි.—(1) මෙම මිළ ගණන් තිරිඟු පිටි විකිණිය යුතු නියමිත මිළ නොවේ. මේ එම ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන් ය. මෙම මිළ ගණන් වලට ඉහලින් තිරිඟු පිටි විකිණිය නොහැකිය.

(2) තොග වශයෙන් විකුණන තිරිඟු පිටි රාත්තල් 150 මිටියකට අඩු හෝ වැඩි ඕනෑම ප්‍රමාණයකට ගෙවිය හැකි උපරිම මිළ, ඉහත සඳහන් රාත්තල් 150 ක මිටියක් තොග වශයෙන් විකිණිය හැකි උපරිම මිළ අනුව සුපුරුදු ලෙස අනුපාතිකව ගණන් බලා සොයා ගන්නා වටිනාකම ය.

1—866/1

---

වී 111 වැනි අංකය දරණ ආහාර මිළ නියෝගය ' පාන් '

මිළ පාලන පනත නියෝගය (173 වන පරිච්ඡෙදය)

වවුනියා දිසාවේ සහකාර මිළ (ආහාර) පාලක තැන්පත් කන්දයියා සිවප්‍රකාසම් වන මම 173 පරිච්ඡෙදයේ මිල පාලන පනතේ 3 (2) දරණ වගන්තිය සමඟ කියවිය යුතු 4 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(i) 1968.02.21 වැනි දින අංක 14,789/19 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද 1968.01.18 වෙනි දින අංක වී 108 දරණ ආහාර මිල නියෝගය වහාම මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(ii) මීට යාකර ඇති උප ලේඛනයේ 2 වන සහ 3 වන තීරවල සඳහන් මිළ, එම උප ලේඛනයේ 1 වන තීරයේ සඳහන් ප්‍රදේශවල පිළිවෙළින් අවුන්ස 16 හා 8 පාන් ගෙඩි මේ දුන් සිට විකිණිය හැකි වැඩිම මිල බවත් එකී මිළට වැඩියෙන් එම ප්‍රදේශවල පාන් ගෙඩි නොවිකිණිය යුතු බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(iii) තවද, මෙම මිළ නියෝගයෙන් කිසිම ප්‍රදේශයක් සඳහා අවුන්ස 16 පාන් ගෙඩියකට නියමිත වැඩිම මිළේ අනුපාතය අනුව වැටහෙන මිළට වැඩියෙන් එම ප්‍රදේශය තුල අවුන්ස 8 ට වඩා බර පාන් ගෙඩියක් නොවිකිණිය යුතු බවත්,

(iv) මෙම මිළ නියෝගයෙන් කිසිම ප්‍රදේශයක් සඳහා අවුන්ස 8 පාන් ගෙඩියකට නියමිත වැඩිම මිළේ අනුපාතය අනුව වැටහෙන මිළට වැඩියෙන්, එම ප්‍රදේශය තුල අවුන්ස 8 ට වඩා බර නොවූ පාන් ගෙඩියක් හෝ පාන් ගෙඩියකින් අවුන්ස 8 කට වඩා බර නොවූ කිසිම කොටසක් නොවිකිණිය යුතු බවත්,

(v) පාන් විකුණන විට ඔකා දෙනු ලබන දෙයක් වෙතොත්, එහි මිළත් මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් වලට ඇතුළත් බවත්,

(vi) මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කර ඇති සෑම ප්‍රදේශයකටම සිය ස්වාමිත්වය හෝ පාලනය යටතේ කිසියම් ස්ථානයක හෝ වාහනයක පාන් ඇති වෙළෙන්දකු මෙම නියෝගයෙන් පාන් සඳහා නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරන ලද දැන්වීමක් පැහැදිලිව පෙනෙනසේ එම ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බවත්,

(vii) මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කොට ඇති සෑම ප්‍රදේශයකම පාන් විකුණන සෑම කෙනෙකුම මිලයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණු දිනය :

(ආ) විකුණු පාන් ගෙඩියේ විස්තර :

(ඇ) විකුණු පාන් ප්‍රමාණය :

(ඈ) විකුණු පාන්වලට ගෙවූ මුදල ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දියයුතු බව මෙම නියෝගයෙන් නියම කරමි.

(viii) තවද, ' අවුන්ස ' යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත අවුන්සයේ බර බවද නියෝග කරමි.

1973 ජනවාරි 12 වැනිදු දහවල් 12.00 ට වවුනියා දිසාපති කාර්යාලයේ දී අත්සන් කරන ලදී.

කේ. සිවප්‍රකාසම්,<br>
වවුනියාව දිසාවේ සහකාර මිළ (අහාර) පාලක.

උපලේඛනය

| 1 වන තීරය<br>ප්‍රදේශය | 2 වන තීරය<br>අවුන්ස 8 ට වඩා බර පාන් සඳහා අදල වැඩිම මිළ | 3 වන තීරය<br>අවුන්ස 8 ක් හෝ ඊට අඩු පාන් සඳහා වැඩිම මිළ |
|---|---|---|
| වවුනියාව දිස්ත්‍රික්කය ... ... ... ... | අවු. 16=ශත 41 ... | අවු. 8=ශත 22 |

1—866/2

**අංක ඇම්.ඇල්. 1973/1 වන අංකය දරණ ආහාර මිළ නියෝගය** **තිරිඟු පිටි**

**මිළ පාලන පනත**

**නියෝගය**

මාතලේ පාලන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර) මිල පාලක තැන්පත් සිරිල් ගමගේ වන මම (173 වන අධිකාරය වන) මිළ පාලන පනතේ 4 වන වගන්තියෙන් සහ එම පනතේ 3 (2) වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1967.11.30 දින අංක 14,777/2 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරණ ලද අංක ඇම්.ඇල්. 1967/7 වන අංකය හා 1967.11.24 දින දරණ ආහාර මිළ නියෝගය මේ දුන් සිට මෙයින් අවලංගු කරමි.

(2) මීට යා කොට ඇති උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් පෙදෙස්වල වෙළෙන්දුන්ට තිරිඟු පිටි තොග වශයෙන් විකිණීමේ දී දල බර රාත්තල් 150 ක් විකිණිය හැකි වැඩිම මිළ එම උපලේඛනයේ 2 වන තීරයේ සඳහන් කර තිබෙන මිළ ගණන් බව මේ දුන් සිට නියම කරමි.

(3) මීට යාකොට ඇති උපලේඛනයේ 1 වන තීරයේ සඳහන් පෙදෙස්වල තිරිඟු පිටි සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බරින් රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ එම උපලේඛනයේ 3 වන තීරයේ සඳහන් කර තිබෙන මිළ ගණන් බව මේ දුන් සිට නියම කරමි.

(4) තවද, මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා—

(අ) තිරිඟු පිටි ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම ද, දල බර රාත්තල් 150 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් විකිණීම ද, තොග වෙළඳාමක් සේ සලකනු ලැබේ ;

(ආ) ශුද්ධ බරින් රාත්තල් 150 කට වඩා අඩු තිරිඟු පිටි ප්‍රමාණයක් ආහාරය සඳහා විකිණීම සිල්ලර වෙළෙඳාමක් සේ සලකනු ලැබේ ;

(ඇ) ඉරිඟු පිටි මිශ්‍ර තිරිඟු පිටි ද තිරිඟු පිටි වශයෙන් සලකනු ලැබේ.

(5) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ කිසියම් ප්‍රදේශයක තිරිඟු පිටි ඉරිඟු පිටි සමග හැර වෙනම කිසියම් ද්‍රව්‍යයක් සමඟ මිශ්‍රකර නො විකිණිය යුතු බව මෙම නියෝගයෙන් නියම කරමි.

(6) එසේම කිසියම් අයකු විසින් තිරිඟු පිටි ප්‍රමාණයේ සියයට දහයකට වඩා ඉරිඟු පිටි තිරිඟු පිටි සමඟ මිශ්‍රකර නො විකිණිය යුතු බව මෙම නියෝගයෙන් නියම කරමි.

(7) තිරිඟු පිටි විකිණීමේ දී එය යම්කිසි දෙයක බහාලනු නම් එහි මිළත් මෙම නියෝගයෙන් නියමිත මිළ ගණන්වලට ඇතුළත් බව මෙයින් නියම කරමි.

(8) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම්කිසි ස්ථානයක හෝ යම්කිසි වාහනයක තිරිඟු පිටි සිය ස්වාමිත්වයේ හෝ තමාගේ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙක්ම එම තිරිඟු පිටි වලින් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා ඒ පිටිවල මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම් වලින් මිළ පුවරුවක ලියා එම පුවරුවට එම භාජනය ඇඳා එම පිටිද එම පුවරුවද ඕනෑම ගණුදෙනු කාරයෙකුට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව මෙයින් නියෝග කරමි.

(9) එසේම මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා '' රාත්තලක් '' හෙවත් '' රා '' යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද මෙයින් නියම කරමි.

(10) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිල නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම තිරිඟු පිටි තොග වශයෙන් විකුණන සෑම තැනැත්තකුම හා සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තකු විසින් ම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම්—

(අ) විකුණූ දිනය,

(ආ) තිරිඟු පිටි විකුණූ ප්‍රමාණය (බර අනුවයි),

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල,

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම් වෙළඳාම තොග වශයෙන්ද, සිල්ලර වශයෙන් ද යන වග ඇතුළත් කුවිතාන්සියක් දිය යුතු බව නියම කරමි.

1973 ජනවාරි මස 13 වන දින පෙ.ව. 10.00 ට මාතලේ දිසාපති කාර්‍ය්‍යාලයේ දී අත්සන් කරන ලදී.

සිරිල් ගමගේ,
මාතලේ පාලන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර) පාලක.

**උපලේඛනය**

| | 1 වන තීරය | | 2 වන තීරය<br>දල බර රාත්තල් 150 ක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශත | | 3 වන තීරය<br>ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශත |
|---|---|---|---|---|---|
| 1. | මාතලේ නගර සභා කොට්ඨාශය, කොහොන්සිය පත්තුව, ගම්පහසිය පත්තුව, අස්ගිරිඋඩසිය පත්තුව අස්ගිරි පල්ලේසිය පත්තුව මාතලේ උඩසිය පත්තුව, මාතලේ මැදසිය පත්තුව | ... | 56 75 | ... | 0 39½ |
| 2. | ඉනාමලුව කෝරළේ, වගපනහ පල්ලේසිය පත්තුව, වගපනහ උඩසිය පත්තුව, උඩුගොඩ උඩසිය පත්තුව, කන්දපල්ල කෝරළේ, උඩුගොඩ පල්ලේසිය පත්තුව ... | ... | 57 16 | ... | 0 40 |
| 3. | අඹන්ගහ කෝරළේ, මාතලේ පල්ලේසිය පත්තුව, ගහල පල්ලේසිය පත්තුව, ගහල උඩසිය පත්තුව (කන්දේපිටවල ග්‍රාම සේවක කොටස හැර) ... ... ... | ... | 56 81 | ... | 0 39½ |
| 4. | පල්ලේගම ග්‍රාම සේවක කොටස හැර ලග්ගල පල්ලේසිය පත්තුව ... | ... | 57 62 | ... | 0 41½ |
| 5. | පල්ලේගම ග්‍රාම සේවක කොටස (ලග්ගල පල්ලේගම) කන්දේපිටවල ග්‍රාම සේවක කොටස | ... | 57 62 | ... | 0 40 |
| 6. | ලග්ගල උඩසිය පත්තුව ... ... ... ... | ... | 56 81 | ... | 0 41 |

සැලකිය යුතුයි.—(1) මේ මිල ගණන් ඉහත සඳහන් ද්‍රව්‍යය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. මේ මිළ ගණන් වලට ඉහළින් ඒ ද්‍රව්‍ය විකිණිය නොහැකිය.

(2) තොග වශයෙන් විකුණන තිරිඟු පිටි දල බර රාත්තල් 150 ට අඩු හෝ වැඩි ඕනෑම ප්‍රමාණයකට ගෙවිය යුතු ඕනෑම මුදලක් ගණන් බැලිය යුත්තේ සිරිත් පරිදි, ඉහත සඳහන් ශුද්ධ බර රාත්තල් 150 ට වැඩිම තොග වෙළඳ මිලෙන් අනුපාතිකවය.

**අංක ඇම්.ඇල්. 1973/2 වන අංකය දරණ ආහාර මිළ නියෝගය** **පාන්**

මිළ පාලන පනත

නියෝගය

මාතලේ පාලන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර) මිළ පාලක තැන්පත් සිරිල් ගමගේ වන මම (173 වන අධිකාරය වන) මිළ පාලන පනතේ 4 වන වගන්තියෙන් සහ එම පනතේ 3 (2) වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1967.11.30 වන දින අංක 14,777/2 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරණ ලද අංක ඇම්.ඇල්. 1967/8 හා 1967.11.24 දරණ ආහාර මිළ නියෝගය මේ දුන් සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උපලේඛනයේ 2 වන සහ 3 වන තීරවල සඳහන් මිළ ගණන් එම උපලේඛනයේ 1 වන තීරයේ සඳහන් ප්‍රදේශවල, පිළිවෙලින් අවුන්ස 16 යේ හා අවුන්ස 8 ටෙ පාන් ගෙඩි මේ දුන් සිට විකිණිය හැකි වැඩිම මිළ බවත්, එකී මිළට වැඩියෙන් එම ප්‍රදේශවල එම පාන් ගෙඩි නොවිකිණිය යුතු බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මෙම මිළ නියෝගයෙන් කිසියම් ප්‍රදේශයක් සඳහා අවුන්ස 16 යේ පාන් ගෙඩියකට නියමිත වැඩිම මිළේ අනුපාතනය අනුව වැටහෙන මිළට වැඩියෙන් එම ප්‍රදේශය තුළ අවුන්ස 8 කට වඩා බර පාන් ගෙඩියක් හෝ පාන් ගෙඩියකින් අවුන්ස 8 කට වඩා බර කිසියම් කොටසක් නො විකිණිය යුතු බවත්,

(4) මෙම මිළ නියෝගයෙන් කිසියම් ප්‍රදේශයක් සඳහා අවුන්ස 8 ටෙ පාන් ගෙඩියකට නියමිත වැඩිම මිළේ අනුපාතය අනුව වැටහෙන මිළට වැඩියෙන්, එම ප්‍රදේශය තුළ අවුන්ස 8 කට වඩා බර නොවූ පාන් ගෙඩියක් හෝ පාන් ගෙඩියකින් අවුන්ස 8 කට වඩා බර නොවූ කිසියම් කොටසක් නො විකිණිය යුතු බවත්,

(5) පාන් විකුණන විට ඔතා දෙනු ලබන දෙයක් වෙතොත් එහි මිළත් මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන්වලට ඇතුළත් බවත්,

(6) මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කොට ඇති සෑම ප්‍රදේශයකම සිය ස්වාමිත්වය හෝ පාලනය යටතේ කිසියම් ස්ථානයක හෝ වාහනයක පාන් ඇති වෙළෙන්දකු මෙම නියෝගයෙන් පාන් සඳහා නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරන ලද දැන්වීමක් පැහැදිළිව පෙනෙන සේ එම ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බවත්,

(7) මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කොට ඇති සෑම ප්‍රදේශයකම පාන් විකුණන සෑම කෙනෙකුම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර එනම්—

(අ) විකුණූ දිනය,

(ආ) විකුණූ පාන් ගෙඩියේ විස්තර,

(ඇ) විකුණූ පාන් ප්‍රමාණය,

(ඈ) විකුණූ පාන්වලට ගෙවූ මුදල ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවත්, මෙම නියෝගයෙන් නියම කරමි.

(8) තවද, " අවුන්ස " යන්නෙන් සලකනු ලබන්නේ ඇවැර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත අවුන්සයේ බර බවද නියම කරමි.

1973 ජනවාරි මස 13 වැනි දින පෙ.ව. 10.00 ට මාතලේ කච්චේරියේ දී අත්සන් කරණ ලදී.

සිරිල් ගමගේ,
මාතලේ පාලන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර) පාලක.

උපලේඛනය

| 1 වන තීරය | 2 වන තීරය<br>අවුන්ස 8 කට වඩා බර පාන් සඳහා අදළ වැඩිම මිළ (අවුන්ස 16 ක්)<br>රු. ශත | 3 වන තීරය<br>අවුන්ස 8 ක් හෝ ඊට අඩු පාන් සඳහා අදළ වැඩිම මිළ (අවුන්ස 8ක්)<br>රු. ශත |
|---|---|---|
| (1) මාතලේ නගර සීමාව තුළ ... ... ... ... ... | 0 40 ... | 0 20½ |
| (2) මාතලේ නගර සභා කොට්ඨාශය හැර මාතලේ ප්‍රා.ආ.නි. කොට්ඨාශය උකුවෙල ප්‍රා.උ.දි. කොට්ඨාශය රත්තොට ප්‍රා.උ.දි. කොට්ඨාශය, දඹුල්ල ප්‍රා.උ.දි. කොට්ඨාශය, ගලේවල ප්‍රා.ආ.නි. කොට්ඨාශය, ලග්ගල උඩසිය පත්තුව හා ලග්ගල පල්ලේසිය පත්තුව හැර ලග්ගල ප්‍රා.ආ.නි. කොට්ඨාශය හා නාඋල ප්‍රා.උ.දි. කොට්ඨාශය. | 0 41 ... | 0 21 |
| (3) ලග්ගල උඩසිය පත්තුව, ලග්ගල පල්ලේසිය පත්තුව ... ... | 0 42 ... | 0 21½ |

1–868/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.